# මාධ්‍ය නිදහස හා සමාජ වගකීම පිළිබඳ කොළඹ ප්‍රකාශනය

2018 සැප්තැම්බර්

# මාධ්‍ය නිදහස හා සමාජ වගකීම පිළිබඳ කොළඹ ප්‍රකාශනය

2018 සැප්තැම්බර්

මාධ්‍ය නිදහස හා සමාජ වගකීම පිළිබඳ කොළඹ ප්‍රකාශනයේ ("ප්‍රකාශනයේ") විසි වැනි සංවත්සරය එළැඹෙන මෙම අවස්ථාවේ දී මෙහි පහත අත්සන් කරන අපි:

ප්‍රකාශනය හා බැඳුණු මූලධර්ම හා හර පද්ධතීන් මෙන්ම මාධ්‍ය නීති ප්‍රතිශෝධනය සඳහා අප විසින් සකස් කරන ලද ක්‍රියාදාම උදෙසා කැපවීමෙන් ක්‍රියාකිරීමට අපි යළි ප්‍රතිඥා දෙන්නෙමු. යළිත් සහතික වන්නෙමු.

ප්‍රකාශනය නැවත සමාලෝචනය කරගැනීමටත් මුලින්ම සම්මතකරගත් දා පටන් මේ දක්වා ඇතිවී තිබෙන ධනාත්මක වර්ධනයන් පිළිගැනීමටත් මුදුන්පත් කරගත නොහැකිවූ බොහෝ අරමුණු සිහිපත් කරගැනීමටත් පැන නැගී ඇති නව අභියෝගවලට මුහුණ දීමට සැළසුම් කිරීමට සැලසුම් සකස් කිරීමටත් අපි මෙය අවස්ථාව කර ගනිමු.

ශ්‍රී ලංකා රජය මාධ්‍ය, සංවර්ධනය හා දරිද්‍රතාව පිටුදැකීම පිළිබඳ 2006 කොළඹ ප්‍රකාශනයේ ("යුනෙස්කෝ ප්‍රකාශනයේ") අත්සන්කරුවකු වූ බවත් එම ප්‍රකාශනය යටතේ සමාජ සාධාරණත්වය හා සංවර්ධනය වෙනුවෙන් කැපවූ නිදහස් බහුවිධ මාධ්‍යයක් ප්‍රවර්ධනය කිරීම උදෙසා එම රජය කැපවී සිටින බවත් අවධාරණයට ගනිමු.

පුවත්පත් නිදහස පිළිබඳ අයිතිය සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදයට රුකුල් දෙන මූලික අයිතිවාසිකමක් බවට 1991 වින්ඩ්හොක් ප්‍රකාශය මගින් තහවුරු කළ බව සිහිපත් කරමු.

1998 ප්‍රකාශනයෙන් යෝජිත ප්‍රතිශෝධන ක්‍රියාත්මක කිරීමෙන් පුවත්පත් කලාවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතතාව තහවුරු කරන අතර ඔවුන්ගේ වෘත්තියෙහි යෙදීම සඳහා ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අයිතිය තහවුරු කිරීම සහ නිදහස්, බහුවිධ හා ස්වාධීන මාධ්‍යයකට කටයුතු කළ හැකි පරිසරයක් නිර්මාණය කිරීම නිදහස් බහුවිධ හා ස්වාධීන මාධ්‍යයක් සාර්ථක කර ගැනීමේ මඟක් බව විශ්වාස කරමු.

ඒ අරමුණ ඉටුකර ගැනීම පිණිස අප 2008 වසරේදී සමාලෝචනය කළ 1998 ප්‍රකාශනයේ සංස්කරණයක් ඉදිරිපත් කිරීම සඳහා මෙම අවස්ථාව උපයෝගී කර ගන්නා අතරම, කොළඹ ප්‍රකාශනයේ න්‍යායාත්මක අභිලාෂ සජීවී යථාර්ථයක් බවට පරිවර්තනය කර ගැනීම සඳහා කටයුතු කිරීමට ද ප්‍රතිඥා දෙමු.

## පූර්විකාව

පහත අත්සන් කරන අපි,

ප්‍රකාශනයේ නිදහස සහ තොරතුරු ලබා ගැනීමේ නිදහස ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් සඳහා අත්‍යවශ්‍ය වන බවත් එහි ප්‍රගතිය හා සුබසාධනය සඳහා මෙන්ම අනෙක් මානව අයිතිවාසිකම් හා මූලික නිදහස භුක්ති විඳීම සඳහා අත්‍යවශ්‍ය බවත් ඒත්තු ගනිමින්,

තම රජයේ කටයුතු නිරීක්ෂණය කිරීමට මහජනතාවට හැකි වීමට, ඔවුනට දේශපාලන දැනුම්වත්භාවය ඇති කර ගැනීමට හා ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළ පූර්ණ වශයෙන් සහභාගීවීමට නම්, ඔවුන්ට තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රවේශය තිබිය යුතු බව සිත් හි ධාරණය කරගනිමින්:

ගැටුම් සහිත වකවානුවක ගැටුම් සමනය කරනු පිණිස නිදහස් හා ස්වාධීන මාධ්‍යයක පැවැත්ම අත්‍යවශ්‍ය වන බවත් නිරන්තර බියජනක තත්ත්වයන් යටතේ මාධ්‍යයට සහ පුවත්පත් කලාවේදීන්ට ක්‍රියාත්මක විය නොහැකි බවත් ඒත්තු ගනිමින්:

ඉහත සඳහන් කාර්යයන් උදෙසා පහසුකම් සැපයීමේලා සමාජය තුළ පුවත්පත් කලාවේදීන් තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කරන බව පිළිගනිමින්:

රාජ්‍ය නිලධරයන්, ඔවුන්ගේ නිල ස්වභාවය අනුවම, සාමාන්‍ය පුද්ගලයන්ට වඩා ඉහළ මට්ටමක විවේචන ඉවසා සිටිය යුතු යැයි සලකා බලමින්:

පොදු ජන ප්‍රශ්න පිළිබඳ විවාද නිර්බාධක හා ප්‍රබල විය යුතු බවත් නිදහස් විවාදයක දී ඇතැම් සාවද්‍ය ප්‍රකාශ සිදු කිරීම නොවැළැක්විය හැකි බවත් අවධාරණය කරන අතරම නෛතික රීති මඟින් එය නිරූපණය විය යුතු බව අවබෝධ කර ගනිමින්:

ප්‍රකාශනයේ සහ මාධ්‍ය නිදහස සම්බන්ධයෙන් සීමා පැණවීම බොහෝවිට අත්තනෝමතික සහ නොමඟයවන සුළු වන බවත්, කරුණු දැන ගැනීම සඳහා වූ මහජනතාවගේ අයිතිවාසිකම හා ප්‍රකාශනයේ නිදහස පිළිබඳ අන්තර්ජාතික සහතික කිරීම් උල්ලංඝනය කිරීමක් බවත් ඒත්තු ගනිමින්:

ඩිජිටල් සන්නිවේදන තාක්ෂණය මඟින් ගෙන එන අති විශාල වෙනස්කම් සහ මෙම වෙනස්කම් සැලකිල්ලට ගැනීම සඳහා වූ නියාමන පද්ධතිවල අවශ්‍යතාව පිළිබඳ දැනුවත්භාවය ඇතිව;

ජනමාධ්‍ය වෘත්තීයවේදීන්ට හා දේපලවලට ප්‍රහාර එල්ල කිරීමේ, ඔවුන් බිය වැද්දීමේ හා තර්ජනය කිරීමේ සිදුවීම් ඉහළ යාම සහ මෙම ක්‍රියාවන් සම්බන්ධයෙන් ඵලදායී විමර්ශන සිදු නොකිරීම හා ඒවා පාදක නඩු පැවරීම් සිදු නොවීම ප්‍රකාශනයේ සහ මාධ්‍ය නිදහසට අගතිගාමී ලෙස බලපෑම් සිදු කිරීම තරයේ සැලකිල්ලට ගනිමින්,

ජාතික ආරක්ෂාවට මුවා වී ප්‍රකාශන නිදහස සහ තොරතුරු ලබා ගැනීමේ නිදහස මත අයුක්ති සහගත තහංචි පැනවීමට රජය ගන්නා පියවර අධෛර්ය කළ හැකි වන පරිදි ඒ දෙයාකාර නිදහස මත ජාතික ආරක්ෂාවේ නාමයෙන් තහංචි පැනවිය හැකි සීමා සහිත පරාසය පිළිබඳ අවබෝධයක් ලැබීමේ නීතිමය ව්‍යුහයක් ප්‍රවර්ධනය කිරීමේ අභිප්‍රායෙන්,

අධිකරණයට අපහාස කිරීම යන්න පැහැදිලිව නිර්වචනය විය යුතුය. එමගින් අධිකරණයට අභිමත පරිදි ඒ ඒ අවස්ථාවල යෝග්‍ය නොවන ආකාරයෙන් එම නීතිය විචාරීමට ලක් කිරීම වැළැකේ. එසේ එම නීතිය විචාරීමට ලක්වූ අවස්ථාවක තීන්දුවත් අධිකරණයත් සාධාරණ ලෙස විවේචනය කිරීමට දෙන අවසරයත්, පුවත්පත් කලාවේදීන්ට තොරතුරු සපයන මූලාශ්‍ර ආරක්ෂා කරගැනීමටත් පසුගිය දශක දෙක තුළ ඵලදායී ලෙස ක්‍රියාත්මකවී නොමැත. ඉහත කාරණා ඇතුළුව ප්‍රකාශනයේ නිදහසට ඇති සීමා අවධාරණය කර ගනිමින්

නිදහස් හා ස්වාධීන මාධ්‍යයක් ප්‍රවර්ධනය කිරීමෙහිලා මාධ්‍ය ක්ෂේත්‍රය තුළ සමාජ වගකීම් සහගතභාවය අවශ්‍ය බව පිළිගනිමින් ඒ තුළින් උසස් වෘත්තීයමය තත්ත්වයක් සාක්ෂාත් කිරීම, එකමුතු හැඟීම ප්‍රවර්ධනය මාධ්‍ය වෘත්තිකයින් අතර පක්ෂග්‍රාහී නොවූ සහයෝගීතාවය හා ආචාරධර්ම සංග්‍රහයට අනුව වෘත්තියේ නියැලීම ස්ථාපිත කළ හැකි බව පිළිගනිමු.

පහත සඳහන් ප්‍රකාශනයට එකඟ වන අතර එහි පුළුල් ව්‍යාප්තිය, පිළිගැනීම හා ක්‍රියාකාරීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා යෝග්‍ය ආයතන මඟින් පියවර ගත යුතු යැයි නිර්දේශ කරමු.

## 1998 කොළඹ ප්‍රකාශනයෙන් පසු ඇති වූ වර්ධනයන්

අපි පසුගිය දශක දෙක තුළ දී සිදු වූ මතු දැක්වෙන ධනාත්මක වර්ධනන් අගය කරමින් සඳහන් කරමු:

අ. දණ්ඩ නීති සංග්‍රහයේ සහ පුවත්පත් මණ්ඩල නීතියේ ඇති සාපරාධී අපහාසය පිළිබඳ විධිවිධාන 2002 වසරේ දී සංශෝධනය කිරීම, අපවාදාත්මක වචන හෝ සංකේත මඟින් ජනාධිපතිවරයා

අපහාසයට ලක් කරනු පිණිස දරන ලද ප්‍රයත්නවලට දඬුවම් පැමිණ වූ දණ්ඩ නීති සංග්‍රහයේ 118 වැනි වගන්තිය ඉවත් කිරීම.

ආ. බරපතළ පාර්ලිමේන්තු වරප්‍රසාද කඩකිරීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට බලය පවරා ඇති (1953) පාර්ලිමේන්තු බලතල හා වරප්‍රසාද පනතේ 1978 සංශෝධනය ඉවත් කිරීම.

ඇ. ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය, පුවත්පත් පැමිණිලි කොමිසම සහ ශ්‍රී ලංකා ජනමාධ්‍ය විද්‍යාලය පිහිටුවීම.

ඈ. සහ ශ්‍රී ලංකා කර්තෘ සංසදය විසින් වෘත්තීය ප්‍රතිපත්ති මාලාවක් (වෘත්තීය ආචාරධර්ම) ඇතිකර ගැනීම.

ඉ. සහ 2015 වසරේදී තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම සහතික කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 14 අ වගන්තිය එකතු කිරීම මඟින් 19වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගැනීම. 2016 වසරේ දී තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පනත සම්මත කර ගැනීම ප්‍රමුඛ තොරතුරු දැනගැනීමේ ස්වාධීන කොමිසම පිහිටුවීම. සහ ශ්‍රී ලංකාවේ නව තොරතුරු යුගයක ක්‍රමික වර්ධනයක් ඇතිවීම.

කෙසේ වුව ද, මෙම ධනාත්මක වර්ධනයන්ට අමතරව 1998 ප්‍රකාශනයේ දක්වා ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස ගෙන ඇති පියවර අල්ප බව අප සටහන් කරන්නේ දැඩි සන්තාපයකිනි. බලයට පත් හැම රජයක්ම පුද්ගලයින් හා මාධ්‍ය වෙනුවෙන් භාෂණයේ පුළුල් නිදහසක් ලබා දීමට මැතිවරණ පොරොන්දු දී තිබියදීත් මෙම ප්‍රතිශෝධන නොසලකා හැරීම කෙරෙහි අපගේ දැඩි සැලකිල්ල යොමුව ඇත.

නිදහස් ප්‍රකාශනයේ අයිතිය යන විෂය ක්ෂේත්‍රය තුළ යම් දිරිගැන්වෙන සුළු අර්ථකථන හරහා ඉදිරි පියවර කිහිපයක් ශ්‍රී ලාංකීය අධිකරණය විසින් ප්‍රථමයෙන් ගනු ලැබූවද මෙසේ ලබාගත් ජයග්‍රහන ව්‍යාවස්ථාදායකයේ උදාසීන බවත් විධායකයේ තනි බලයත් අධිකරණයේ පවතින සංස්ථිතික භාවයත් ඉදිරියේ අහිමිව ගියේය.

එහෙයින් අපි මතු දැක්වෙන ප්‍රතිශෝධන සඳහා අපගේ ඉල්ලීම් යළි යළිත් ඉදිරිපත් කරමු:

## 1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විධිවිධාන

### 1.1 ප්‍රකාශනයේ නිදහස පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහතිකවීම්

1.1.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (1) (ජී) වගන්තියෙන් පුරවැසියෙකු වන කිසියම් තැනැත්තෙකුට හෝ තැනැත්තියකට ශ්‍රී ලංකා ජනරජය තුළ තනිව හෝ අන් අය සමඟ ඕනෑම නීත්‍යානුකූල රැකියාවක, වෘත්තියක, වෙළෙඳාමක, ව්‍යාපාරයක හෝ ව්‍යවසායකයක යෙදීමට ඇති අයිතිවාසිකම සහතික කිරීම යටතේ පවතින ආරක්ෂා සහතිකය මත සිය වෘත්තියෙහි යෙදීමට ජනමාධ්‍ය වෘත්තිකයන්ට නිදහස තිබිය යුතුය.

1.1.2 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (1) (අ) වගන්තියේ දක්වා ඇති භාෂණයේ නිදහස සහ අදහස් පළ කිරීමේ නිදහස සහතික කිරීම විශේෂයෙන්ම 1980 දී ශ්‍රී ලංකාව විසින් අපරානුමත කරන ලද සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය වැනි රටේ අන්තර්ජාතික නෛතික බැඳීම්වලට සමාන කළ යුතුය. විශේෂයෙන්ම, අයිතිවාසිකම මඟින් අදහස් දැරීම සඳහා පූර්ණ ආරක්ෂාව ලබා දිය යුතුය, දේශ සීමා භේදයකින් තොරව සහ ප්‍රඥප්තියේ (පහත දක්වා ඇති )19 (1) සහ 19 (2) වගන්තිවලට අනුව ඕනෑම මාධ්‍යයක් හරහා තොරතුරු හා අදහස් “සොයා බැලීමේ,

ලබා ගැනීමේ හා බෙදාහැරීමේ" අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතුය.

ප්‍රඥප්තියේ 19 (1) සහ (2) වගන්ති - වලින් මෙසේ ප්‍රකාශිතය:

1. සෑම තැනැත්තෙකුටම බාධාවකින් තොරව සිය මත දැරීමේ අයිතිය තිබිය යුත්තේය.
2. සෑම තැනැත්තෙකුටම අදහස් පළ කිරීමේ නිදහස තිබිය යුතුය; තොරතුරු හා සියලු ආකාරයේ අදහස් සොයා බැලීමේ, ලබා ගැනීමේ හා වාචිකව, ලේඛනයෙන්, මුද්‍රණයෙන්, කලා ස්වරූපයෙන් හෝ තමා රිසි අනෙක් කවර හෝ මාධ්‍යයකින් හෝ දේශ සීමා භේදයකින් තොරව බෙදා හැරීමේ අයිතිය ද ඊට ඇතුළත් විය යුතුය.

## 1. 2 මූලික අයිතිවාසිකම් පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සීමාවන්.

ප්‍රකාශනයේ නිදහස පිළිබඳ පුළුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල විධිවිධානයකින් මෙම අයිතිවාසිකම සීමා කිරීම සඳහා විධායකයට හා ව්‍යවස්ථාදායකයට අනිසි ඉඩ ප්‍රස්ථාවක් සලසන්නේ නම් එවැනි විධිවිධානයක් ඵල රහිත වනු ඇත. එම අයිතීන් හිමිකම් මිස වරප්‍රසාද නොවන බව හඳුනාගෙන ඉහත තත්ත්වයන් මගහැරීම පිණිස පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක විය යුතුය.

(i) මානව අභිමානය, සමානාත්මතාව හා නිදහස ආශ්‍රිත සීමාවල අවශ්‍යතාවන් මත සහ අ) අයිතිවාසිකමේ ස්වභාවය; ආ) සීමා කිරීමේ පරමාර්ථවල වැදගත්කම; ඇ) සීමාවේ ස්වභාවය හා ප්‍රමාණය; ඈ) සීමා කිරීම සහ එමගින් ආරක්ෂා කරන අයිතිවාසිකම්වලට ඇති කරන කිසියම් වැදගත් අවදානම් අතර ඇති කාලීන බැඳීම ඇතුළු බැදීම; සහ ඉ) අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වූ කිසියම් සීමාකාරීත්වය අඩු ක්‍රම ඇතුළු සියලු සාධක සැලකිල්ලට ගනිමින් විවෘත හා ප්‍රජාතාන්ත්‍රික සමාජයක් තුළ සාධාරණ, යුක්තිසහගත හා අවශ්‍ය සීමාවන් සඳහා පමණක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ඉඩ ලබා දිය යුතුය.

(ii) මෙයට අමතරව සීමාවන්, නීතිය මඟින් දක්වා ඇති සීමාවලට පමණක් ඉඩ දෙන සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් හෝ කීර්තිය හෝ ජාතික ආරක්ෂාව, මහජන සාමය හෝ මහජන සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියේ 19 (3) වගන්තිය යටතේ අවසර දී ඇති සීමාවන් ඉක්මවා නොයා යුතුය.

## 1.3 පාර්ලිමේන්තු වරප්‍රසාද

පාර්ලිමේන්තු වරප්‍රසාද සම්බන්ධ ප්‍රකාශනයේ නිදහස ඇතුළු අයිතිවාසිකම් සීමා කර දක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන හේතුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අනවශ්‍ය බලයක් පිරිනමන බැවින් සහ ප්‍රකාශනයේ නිදහස පිළිබඳ අන්තර්ජාතික සහතිකවලට ගරු කිරීමට අසමත් වන බැවින් එම විධිවිධාන ඉවත් කළ යුතුය. (1953) පාර්ලිමේන්තු බලතල හා වරප්‍රසාද පනත එහි මුල් තත්ත්වයට ආපසු පත් කළ යුතු වන අතර ඊට ආනුෂංගිකව සිදු කළ සංශෝධන ඉවත් කළ යුතුය.

## 1.4 හදිසි නීති ක්‍රියාත්මක වන අවස්ථාවල දී මූලික අයිතිවාසිකම් හීනවීම

හදිසි නීති ක්‍රියාත්මක වන අවස්ථාවල දී මූලික අයිතිවාසිකම් මත පණවන සීමාවන් ශ්‍රී ලංකා සන්දර්භය තුළ ඇගයීමට ලක් කර ඇති ලෙස, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියේ (ICCPR) 4 වැනි වගන්තියෙන් ඉඩ සලසන පරිදි සීමා කළ යුතුය.

i. ඒවා පැනවිය යුත්තේ නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද පොදු හදිසි තත්ත්වයක් පවත්නා අවස්ථාවක දී ජාතියේ පැවැත්මට තර්ජනයක් වන්නේ නම් පමණකි.

ii. එම සීමාවන් ජාත්‍යන්තර නීතිය යටතේ අනෙක් බැඳීම්වලට අනනුකූල නොවන පරිදි පවත්නා තත්ත්වයේ හදිසි අවශ්‍යතාවට සරිලන ප්‍රමාණයකට පමණක් සීමා කළ හැකිය.

iii. එම සීමාවලින් වර්ගය, කුලය, වර්ණය, ස්ත්‍රී-පුරුෂ භේදය, ලිංගික නැඹුරුව, භාෂාව, ආගම හෝ සමාජ පසුබිම හෝ දේශපාලන මත පදනම්ව වෙනස් කොට සැලකීමක් සිදු නොවිය යුතුය.

iv. ඇතැම් අයිතිවාසිකම්, එනම් ජීවිතයට ඇති අයිතිවාසිකම, වධහිංසාවලින්/කෲරත්වයෙන්, අමානුෂික හෝ අවමන් සහගත සැලකිලි හෝ දඬුවම්වලින් නිදහස්ව සිටීමට ඇති අයිතිවාසිකම, ආර්ථික බැඳීමක් ඉටු කිරීමට නොහැකි වීමේ හුදු හේතුව මත බන්ධනාගාරගත කරනු ලැබීමෙන් නිදහස්ව සිටීමට ඇති අයිතිවාසිකම යනාදී හිමිකම් කුමන තත්ත්වයන් යටතේ වුව ද ලිහිල් නොකළ යුතුය.

### 1.5 ව්‍යවස්ථා සම්පාදනයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුරූපීබව පිළිබඳ අධිකරණ සමාලෝචනය

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 16 (1) ව්‍යවස්ථාව ඉවත් කර ඒ වෙනුවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූලවීමේ පදනම මත පවතින නීති සහ යෝජිත නීති සම්බන්ධයෙන් ඕනෑම අවස්ථාවක දී අධිකරණ සමාලෝචනයට ඉඩ දෙන රීතියක් ප්‍රතිස්ථාපනය කළ යුතු වන අතර ව්‍යවස්ථා පිළිබඳ අධිකරණ සමාලෝචනය සම්බන්ධයෙන් කිසිදු කාල සීමාවක් නොතිබිය යුතුය.

### 1.6 අයිතිවාසිකම් සීමා කරන නීති

ආයතනවලට හා පුද්ගලයින්ට ඇති ප්‍රකාශනයේ සහ තොරතුරු නිදහස ඇතුළු තොරතුරු දැනගැනීමේ පනතෙන් ලැබී ඇති අයිතියට බාධා කෙරෙන නව නීති ස්ථාපිත කිරීමෙන් රජය වැළැකී සිටිය යුතුය.

## 2. පුවත්පත් හා මුද්‍රිත මාධ්‍ය නීති

### 2.1 නිල රහස් පනත

නිල රහස් යන්න නොපැහැදිලි ලෙස හා පුළුල්ව අර්ථ දක්වන නිල රහස් පනත ඉවත් කිරීම හෝ එම පනත අන්තර්ජාතික සම්මත අනුව සකස් කිරීම සඳහා සංශෝධන ඉදිරිපත් කළ යුතුය.

### 2.2 පුවත්පත් මණ්ඩල නීතිය 1973

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම නමින් මේවනවිට ක්‍රියාත්මක ස්වයං-නියාමන මුල්පිරීම සලකා බලමින් ජනමාධ්‍යවේදීන්, කර්තෘවරුන්, මෙන්ම ප්‍රකාශකයින් සිරගතකිරීමේ හා දඬුවම් ලබා දීමේ නියෝග සහිත මෙම නීතිය අහෝසි කළ යුතුය.

### 2.3 ලංකාවේ එක්සත් ප්‍රවෘත්ති සමාගමේ හිමිකාරීත්වය (ANCL) පුළුල් කිරීම)

ලංකාවේ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (විශේෂ විධිවිධාන) නීතියෙන් සමස්ත වශයෙන් ඒකාර්ථයෙන්ම ප්‍රකශ වී ඇත්තේ ආයතනයේ අයිතිය පුළුල් කිරීමේ ප්‍රතිපත්තිය හැරුණු කොට එය ජනසතු කිරීමක් නොවේ. කලින් කලට බලයට පත් ශ්‍රී ලාංකික රජයන් නීතියේ අභිප්‍රාය අනුව යමින් ලේක් හවුස් ආයතනයේ

අයිතිය පුළුල් කරන බවට මැතිවරණ ප්‍රකාශන මඟින් ප්‍රතිඥා දී ඇති අතර 1996 ආණ්ඩුව පත් කළ කමිටුවක් සමාගමේ අයිතිය පුළුල් කිරීම සඳහා යොදා ගත යුතු උපක්‍රමයක් යෝජනා කර ඇත. එහෙත් එම නිර්දේශ ක්‍රියාත්මක වී නොමැත. ලංකාවේ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම පිළිබඳ මෙම විධිවිධාන ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍යය වේ.

## 3. රාජ්‍ය ද්‍රෝහීත්වය

රජයට විරුද්ධව කැරලි ගැසීම යන්න දණ්ඩ නීති සංග්‍රහයේ සඳහන් වන්නේ 19වැනි ශතවර්ෂයට ගැලපෙන ලෙස පමණට වඩා වැඩි විෂය ක්ෂේත්‍රයක් අයත් කර ගෙනය. එම නිසා එය අහෝසි කිරීම හෝ ප්‍රතිශෝධනය කළ යුතු වේ. මෙය මෙරටේ ව්‍යාවස්ථාවේ මූලධර්මයන්ට අනුකූලවන භාෂණයේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසත් ඊට අදාළ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ප්‍රමිතීන්ට අනුවත් සකස් කළ යුතු වේ.

## 4. අධිකරණයට අපහාස කිරීම සහ මූලාශ්‍ර ආරක්ෂාව

මතු සඳහන් දෑ ඇතුළත්ව, අධිකරණ අපහාස නීතියට අයත් පරාසය නිශ්චිතව පැහැදිලි කරනු පිණිස ස්ථාවර හා පටිපාටිගත “අධිකරණ අපහාස පනතක්” අළුතෙන් සකස් කළ යුතුය.

a) 1981 එක්සත් රාජධානියේ අධිකරණ අපහාස පනත සහ 1971 ඉන්දියාවේ අධිකරණයට අපහාස කිරීමට අදාල පනත සැලකිල්ලට ගෙන අධිකරණයට අපහාස කිරීමේ නීතියට හා විනිශ්චයාභිමුඛ රීතියට අයත් පරාසය නිශ්චිතව පැහැදිලි කරගත යුතුය.

b) අධිකරණ තීන්දු, අධිකරණයේ චර්යාව හා අධිකරණ පටිපාටිය, සහේතුකව හා සාධාරණව විවේචනය කිරීමටත් නඩු විභාග අධිකරණය හමුවේ පවත්නා අවස්ථාවක යුක්තිය පසඳලීම කෙරෙහි නියත අගතියක් සිදු නොවන සීමාව දක්වා එසේ කිරීමටත් නීතියෙන් ඉඩ ලැබිය යුතුය.

c) මෙම නීතියෙන් ජනමාධ්‍ය මූලාශ්‍රවල රහස්‍යභාවය ආරක්ෂා විය යුතුය. මූලාශ්‍රවල රහස්‍යභාවයට හෝ ඊට අදාළ පොදු නීතියට අයත් ව්‍යතිරේඛ පැහැදිලිව නිර්වචනය විය යුතුය.

d) අපහාස චෝදනා නිර්ණය කිරීම සඳහා සාධාරණ කාර්ය පටිපාටි මේ පනතෙන් නියම විය යුතුය. අපහාසයක් සිදු වී ඇතැයි තහවුරු වූ විට පැවැරිය යුතු උපරිම දඬුවම මේ නීතියෙන් නියම විය යුතුය.

## 5. ප්‍රකාශන තහනම් කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලව ලද හැකි අවසරයත් ප්‍රකාශනයේ හා තොරතුරු ලබා ගැනීමේ නිදහසට අනුකූලවත් හැර ඉන් බැහැරව සිදුවන අතපෙවීම් වළක්වනු පිණිස ප්‍රකාශන තහනමත් ප්‍රකාශන ආනයනය මත පනවන රේගු තහනමත් පිළිබඳ නීතියේ වර්තමාන තත්ත්වය පැහැදිලි කළ යුතුය.

## 6. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 6 වැනි සංශෝධනය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 6 වැනි සංශෝධනයේ අන්තර්ගත විධිවිධාන භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස පිළිබඳ අයිතිවාසිකම සමඟ නොගැටෙන බව සහතික කිරීම පිණිස එම විධිවිධාන සංශෝධනය කළ යුතුය.

## 7. හදිසි නීතිය යටතේ වාරණය සහ වෙනත් සීමා කිරීම්

7.1 සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියේ 19(3) දක්වා ඇති ප්‍රමිති හැරුණු කොට ප්‍රකාශනය පූර්ව වාරණයකට ලක් නොකළ යුතුය. හදිසි අවස්ථා තත්ත්වයක් මත පදනම්ව ප්‍රකාශනය සීමා කරන ඕනෑම රෙගුලාසියක් ගැසට් පත්‍රයේ පළ කර භාෂා තුනෙන්ම මාධ්‍ය තුළ ප්‍රසිද්ධ කළ යුතු වන අතර නියමිත කාල සීමාවක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමැතියට යටත් විය යුතුය.

7.2 හදිසි අවස්ථා අතරතුර දී වාරණය සම්බන්ධ රීති ජාතික ආරක්ෂාව, භාෂණයේ හා තොරතුරු සඳහා ප්‍රවේශ වීමේ නිදහස පිළිබඳ "ජොහැන්නස්බර්ග් මූලධර්මවල" ප්‍රමිතිවලට අනුකූල විය යුතුය.

7.3 1947 මහජන ආරක්ෂක ආඥා පනත යටතේ පනවන සියලුම රෙගුලාසි අවශ්‍යතාව සහ ප්‍රමාණානුකූලතාව පිළිබඳ ව්‍යවස්ථාමය පරීක්ෂණවලට භාජනය විය යුතුය. හදිසි නීතිය යටතේ කිසියම් ජනමාධ්‍යවේදියෙක් අත්අඩංගුවකට ගැනීමකදී පහත දැක්වෙන කරුණු සම්පූර්ණ කළ යුතුය: අත්අඩංගුවට ගැනීමේ පරමාර්ථය නොපැහැදිලි හෝ සාමාන්‍ය සැකය මත පදනම්වූවක් නොව නීතියට අනුව යුක්තිසහගත විය යුතුය; අත්අඩංගුවට ගැනීම සඳහා හේතු ඉදිරිපත් කළ යුතුය; අත්අඩංගුවට ගත් පුද්ගලයා වහාම අධිකරණයකට ඉදිරිපත් කළ යුතුය.

7.4 අධිකරණයයේ පූර්ව අනුමැතියකින් තොරව, ඕනෑම හදිසි නීති රෙගුලාසියක් අනුව හෝ 1979 ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ විධිවිධාන අනුව හෝ ඕනෑම ප්‍රකාශනයක් තහනම් කිරීමට හෝ පුවත්පතක් මුද්‍රණ කරන මුද්‍රණ ආයතන මුද්‍රා තැබීමට ඇති අවසරය අවශ්‍යතාවයේ සහ ප්‍රමානුකූලතාවේ පරීක්ෂණ පිළිබඳ විධායක බලතල වලට යටත්වන ලෙස සංශෝධනය කළ යුතුය. මේ සඳහා දඬුවම් නියම කිරීමට අදාළ කාරණ ද ඇතුළත් විය යුත්තේය. (උදාහරණයක් ලෙස මේ මගින් පුවත්පත් මුද්‍රා තැබීමේ ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග ආදිය වැළැක්විය හැකිය)

7.5 ත්‍රස්තවාදය වැළැක්වීමේ යෝජිත නීති ප්‍රතිපාදනයන් තුළ තොරතුරු දැනගැනීමේ අයිතීය පිළිබඳ මූලධර්මයන්ට බාධාවන අයුරින් රහසිගත තොරතුරු සම්බන්ධයෙන් යල් පැනගිය නීති පිළිබඳ පුළුල් නිර්වචනයන් අන්තර්ගත නොවිය යුතුය. එමෙන්ම එය ජනතාවගේ සහ ජනමාධ්‍යයේ භාෂණයේ හා තොරතුරු අයිතය භුක්ති විඳීම අපහැදිලි ලෙසවත් වැළැක්වීම නොකළ යුතුය.

## 8. පුවත්පත් කඩදාසි මත වූ අධික පිරිවැය

මුද්‍රණ කඩදාසි මත පණවන අධික බදු බර හේතුවෙන් පුවත්පත් හරහා තොරතුරු බෙදාහැරීමට වැය වන පිරිවැය ඉහළ යාම සමග විශේෂයෙන්ම ආර්ථික දුෂ්කරතා ඇති තැනැත්තන්ට අධික වියදමක් දැරීමට සිදු වී ඇත. දැනුම වඩා හොඳින් බෙදා හැරීමටත් ව්‍යාප්ත කිරීමටත් ආනයන බද්ද, ප්‍රබල බාධකයක් වී තිබේ. එබැවින් පුවත්පත් මුද්‍රණ කඩදාසි ආනයන සඳහා බදු අය නොකළ යුතුය.

වාරණය හා බාධාකාරී මාධ්‍ය නීති යනාදී ඍජු ක්‍රියාමාර්ග මඟින් පමණක් නොව මුද්‍රණ කඩදාසි වියදම හා ආනයන බදු යනාදී වශයෙන් යටිතල කටයුතු මඟින්ද භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස හීන විය හැකි බව ඒත්තු ගැනීම වැදගත්ය. මුද්‍රණ කඩදාසි මත පැනවෙන අත්‍යාධික ආනයන බද්ද හේතු කොටගෙන පුවත්පත් පවත්වා ගෙන යාමට නොහැකි තත්ත්වයක් උද්ගත වන බවත් එහි ප්‍රතිඵලයක් වශයෙන් භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස උල්ලංඝනය විය හැකි බවත් තීන්දු කළ ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය යතෝක්ත මූලධර්මය පිළිගත්තේය. ශ්‍රී ලංකාවේ පුවත්පත් මුද්‍රණය සඳහා වැයවන මුළු පිරිවැයෙන් විශාල ප්‍රමාණයක් පුවත්පත් මුද්‍රණ කඩදාසි සඳහා වැයවේ.

## 9. මහජන සේවා විකාශන

9.1 රාජ්‍ය අරමුදලින් යැපෙන සහ රාජ්‍ය කළමනාකරණය යටතේ පවතින සියලුම ශ්‍රී ලාංකීය විකාශන සේවාවන් ස්වාධීන වූ මහජන ආයතන බවට පරිවර්තනය කළ යුතුය. ඒවා කිසිම අයුරකින් ආණ්ඩුවේ පාලනයට හෝ දේශපාලන හස්තයකට යටත් නොවිය යුතුය.

9.2 රාජ්‍ය අරමුදල් සැපයෙන විකාශන සේවා ස්වාධීන හා සමබර නියෝජනාත්මක සංයුතියකින් යුත් පාලන ආයතන මගින් පාලනය වන බවට සහතික කළ යුතු අතර පොදු සේවා විකාශනවල සාරධර්ම සුරක්ෂිත කළ යුතුය.

## 10. ස්වාධීන මාධ්‍ය අධිකාරිය

බුද්ධිමය වශයෙන් සිතා බලා ස්වයං නියාමන මූලධර්ම මත පදනම්ව මුද්‍රිත, විද්‍යුත්, විකාශන සහ සමාජ මාධ්‍ය පාර්ශවකරුවන් ඇතුළත් වන පරිදි ස්වාධීන් ජනමාධ්‍ය අධිකාරියක් ස්ථාපිත කළ යුතුය.

අවමවශයෙන් කළ යුතු මතු දැක්වෙන කාරණා

10.1 ස්වාධීන විකාශන අධිකාරියක්
රාජ්‍ය හෝ රාජ්‍ය නොවන මැදිහත්වීමකින් තොර වූ අතිශය නිදහස් ස්වාධීන විකාශන අධිකාරියක් පිහිටවිය යුතුය. විකාශන ප්‍රතිපත්ති ක්‍රියාවට නැගීම, අධීක්ෂණය කිරීමෙත් (ප්‍රජා, මහජන හෝ වාණිජ්‍ය විකාශකයන් වේවා) තාක්ෂණික අංශ ද සැලකිල්ලට ගනිමින් විකාශකයින් හට බලපත්‍ර ලබා දීමේ වගකීම දැරීමෙත් එකී අධිකාරිය විසින් කළ යුතුය. එම අධිකාරිය පිහිටුවීමට පදනම්වන ව්‍යාවස්ථාව මගින් බලපත්‍ර ලබා දීමේදී, පොදුජන සුබසිද්ධියට අදාළ විවිධ තොරතුරු හා අදහස් ලබා ගැනීමට ජනතාවට ඇති අයිතිය විකාශකයින් විසින් පිළිගන්නා බවටත්, විකාශකයන් උසස් වෘත්තීය මට්ටමක සිටිය යුතු වීමේ අවශ්‍යතාවත්, ඔවුන් ප්‍රවෘත්ති හා කාලීන් තොරතුරු වැඩසටහන් මගින් පළ කිරීමේදී දේශපාලනික තුළිත භාවයෙන් කටයුතු කළ යුතු බවටත්, විකල්ප අදහස් පළකරද්දී සාධාරණත්වයේ සහ තුළිත බවේ මූලධර්ම පවත්වාගෙන යායුතු බවටත් සහතිකවන පැහැදිලි නීති සකස් කළ යුතු වේ. මෙම අධිකාරියට  සාමාජිකයන් තොරාගැනීමේ ක්‍රියාපටිපාටිය කිසිඳු තනි දේශපාලන සමූහයක ආධිපත්‍යයට අවනත නොවන බව තහවුරු විය යුතුය.

10.2 ප්‍රජා ගුවන් විදුලි හා රූපවාහි සේවා -
ප්‍රජා ගුවන්විදුලි හා රූපවාහිනි සේවාවක් ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිපත්ති මාලාවක් නෛතික වශයෙන් සම්පාදනය විය යුත්තේය. ඉහත කී ස්වාධීන අධිකාරිය මෙම අංශය නියාමනය කළ යුතුය. මෙම මාධ්‍ය සේවා මගින් විකාශනය කරන වැඩසටහන් වලින් අවම වශයෙන් සියයට 50 ක් ප්‍රජාවගේ ප්‍රාදේශීය අවශ්‍යතා සම්බන්ධයෙන් වන බවට එකී අධිකාරිය වග බලා ගතයුතුය.

## 11. අන්තර්ජාලය

11.1 අන්තර්ජාලයේ ව්‍යාප්තිය 1998 කොළඹ ප්‍රකාශනය සම්මත කර ගැනීමේ සිට ඇතිවුණු වර්ධනීය සංසිද්ධියකි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මාධ්‍ය ප්‍රජාතන්ත්‍රීකරණය වී ඇති අතරම බ්ලොග් වෙබ් අඩවි පවත්වා ගෙනයන්නන් මෙන්ම වෘත්තිය නොවන පුරවැසි මාධ්‍යකරුවෝ ද දිරිගැන්වී සිටිති. නිදහස් භාෂණයත් ප්‍රජාතන්ත්‍රවාදී මාධ්‍යයත් වෙනුවෙන් බ්ලොග් වෙබ් අඩවිකරුවන්ගෙන් පිරිනැමෙන දායකත්වය අපි පිළිගන්නෙමු. එමෙන්ම එම බ්ලොග් වෙබ් අඩවි පවත්වාගෙන යන්නන් රාජ්‍ය පාලනයට පහසුවෙන් හසුවිය හැකි කොටසක් ලෙස අපි හදුනාගෙන ඇත. ඔවුන්ගේ මාධ්‍ය කටයුතු

සාම්ප්‍රදායික මාධ්‍ය භූමිකාවක් ලෙස වැරදි ලෙස  නිර්වචනය වීමට ද හැකියාවක් ඇත.

බ්ලොග් වෙබ් අඩවිකරුවන්ටත් අනෙකුත් නව මාධ්‍ය ක්‍රියාකරුවන්ටත් අපගේ සහයෝගය පළ කිරීමට මෙය අවස්ථාවක් කරගන්නා අතරම සමාජ වගකීමක් සහිත මාධ්‍ය භූමිකාවක් උදෙසා අපි ඔවුන්ව ධෛර්යමත් කරන අතරම වෛරී කථනය සහ අසභ්‍ය ද්‍රව්‍ය ප්‍රචලිත කිරීම වැනි කටයුතුවලින් ඈත්ව ශක්තිමත් සහ ස්වාධීන ඒකරාශි මාධ්‍යයක් ස්ථාපනය කර ගැනීම සඳහා ඔවුන් සමග සහයෝගයෙන් කටයුතු කිරීමට බලාපොරෙත්තු වෙමු.

අපගේ සහයෝගය දැක්වීමට අප මේ අවස්ථාව උපයෝගි කර ගන්නා අතරම ශක්තිමත් හා ස්වාධීන ඒකරාශී මාධ්‍යයක් ස්ථාපනය කිරීමේ අරමුණ ඇතිව ඔවුන් හා ඒකාබද්ධව කටයුතු කිරීමටද අපි බලාපොරොත්තු වෙමු.

11.2 අන්තර්ජාලය සංවාදාත්මක ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ඉතා වැදගත් අවකාශයක් ලෙස සලකන ලෙස, නිදහස් භාෂණය සඳහා අන්තර්ජාලය තුළ ද ඉඩකඩ පුළුල් කරන අන්දමේ ප්‍රතිපත්ති ඒ වෙත ද ව්‍යාප්ත කරන ලෙස මෙන්ම සාධාරණ පදනම් නොමැතිව වෙබ් අඩවි තහනම් කිරීමේත් ඊට බාධා පැමිණවීමේ හා එය වාරණයට ලක් කිරීමේ සියලු ප්‍රතිපත්තිවලින් වළකින ලෙස අපි රජයෙන් විශේෂයෙන්ම ඉල්ලා සිටිමු. මේ වන විට අන්තර්ජාලගත පුවත්පත් කීපයක් සමඟ සාම්ප්‍රදායික මුද්‍රිත මාධ්‍යයත් අන්තර් ජාලයත් අතර අභිසරණයක් ඇති හෙයින් මේ ප්‍රකාශනයෙන් අපේක්ෂිත සියලු වරප්‍රසාද හා ආරක්ෂාව පුවත්පත් වෙබ් මුද්‍රණ වෙත ද ව්‍යාප්ත කරන මෙන් අපි තරයේ ඉල්ලා සිටිමු.

11.3 අන්තර්ජාලය පාලනය කළ යුතු සුදුසු නෛතික හා නියාමන රීති මොනවාද යන්න තීරණය කිරීම පිණිස පුළුල් සාමාජ විවාදයක් පැවැත්විය යුතු වන අතර අන්තර්ජාලය විශේෂ රෙගුලාසි ක්‍රමයකට භාජනය නොවන බවටත්, අන්තර්ජාල සන්නිවේදනය මත පොදු යෙදවුම් රීති වෙනුවට නව රීති පැණවීමක් සිදු නොවන බවටත්, කේතනය හා නිරනාමික මෙවලම් අන්තර්ජාලය තුළ දී භාවිතා කිරීමට සෑම තැනැත්තෙක් සඳහාම අයිතියක් ඇති බවටත් අන්තර්ජාලය සඳහා විශ්වීය ප්‍රවේශය දිරිමත් කිරීම වෙනුවෙන් රජයට ධනාත්මක බැඳීමක් ඇති බවටත් මෙම රීතිවලින් සහතික කළ යුතුය.

## 12. නීති සමාලෝචනය

ප්‍රකාශනයේ නිදහස සීමා කරන සියලුම නීති අන්තර්ජාතික සම්මත වලට සමාන කරවීම පිණිස සමාලෝචනය කර සංශෝධනය කළ යුතුය. විශේෂයෙන්ම 1927 අසැබි ප්‍රකාශන නීතිය සහ  1912 ප්‍රසිද්ධ රැඟුම් පාලන ආඥා පනත, ප්‍රසිද්ධ රැඟුම් පාලන මණ්ඩල පනත, 1958 ආගම් විරෝදී ප්‍රකාශන පනත සමාලෝචනය විය යුතුය.

## 13. මාධ්‍ය ආයතනවල හා මාධ්‍යවේදීන්ගේ වගකීම් - ස්වයං-නියාමනය සඳහා සහය දක්වන - ස්වේච්ඡා ආචාර ධර්ම පද්ධතිය.

13.1 ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය, ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම, ශ්‍රී ලංකා ජනමාධ්‍ය විද්‍යාලය, ශ්‍රී ලංකා පුවත්පත් සංගමය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, ශ්‍රි ලංකා වෘත්තිය පත්‍ර කලාවේදීන්ගේ සංගමය, ශ්‍රී ලංකා දෙමළ මාධ්‍ය සන්ධානය, ශ්‍රි ලංකා මුස්ලිම් සංසදය, මාධ්‍ය සේවක වෘත්තීය සම්මේලනය සහ දකුණු ආසියානු නිදහස් මාධ්‍ය සංවිධානයේ ශ්‍රී ලංකා පාර්ශ්වය යනාදී සංවිධාන විසින් අනුමත කරනු ලැබ දැනට වලංගුව පවත්නා, ශ්‍රී ලංකා කර්තෘ සංසද වෘත්තීය ආචාරධර්ම පද්ධතියෙන් මුද්‍රිත මාධ්‍යයේ සියලු ආයතන/මාධ්‍යකරුවෝ බැඳී සිටිය යුත්තෝය. මුද්‍රිත මාධ්‍යයේ

සියලු ආයතන/මාධ්‍යකරුවෝ ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම සමග සහයෝගයෙන් කටයුතු කළ යුතු වන අතර කොමිසමේ ලේකම් කාර්යාලයේ නිවේදන සහ කොමිසමේ ආරාවුල් නිරාකරණ මණ්ඩලයේ තීන්දු පිළිපැදීමටත් බැඳී සිටිය යුත්තෝය.

13.2 මාධ්‍යයක් නිදහස් විය යුත්තේ හුදෙක් දේශපාලන බලපෑම්වලින් පමණක්ම නොවන බවටත් අයෝග්‍ය වාණිජ්‍ය බලපෑම්වලින් හා පාලනයෙන් ද නිදහස්ව සිටීමට මාධ්‍ය වෑයම් දැරිය යුතු බවටත් අපි පිළිගනිමු. මාධ්‍ය වෙළෙඳ ප්‍රචාරක දැන්වීම් මත යැපෙන බව අප පිළිගන්නා අතරම ඇතැම් වෙළෙඳ ආයතන ප්‍රචාරක දැන්වීම් නොදී සිටීම මඟින් මාධ්‍ය වෙත බලපෑම් එල්ල කිරීමේත් කතුවැකි ඉඩකඩ පවා ග්‍රහණය කර ගැනීම සඳහා ප්‍රයත්න දැරීමේත් ප්‍රවණතාවක් ලෝකයෙහි පවත්නා බවත් අපි පිළිගනිමු. එවැනි අයෝග්‍ය වාණිජ්‍ය බලපෑම්වලින් නිදහස්ව මාධ්‍ය පවත්වාගෙන යෑමට අපි වෑයම් කරන්නෙමු. වෙළෙඳ ප්‍රචාරක දැන්වීම්වල වාසියෙන් අපගේ කර්තෘ මණ්ඩල හා ප්‍රවෘත්ති ප්‍රතිපත්තියට බලපෑම් එල්ල නොවීමට මෙන්ම අපගේ අවංකභාවය හා වාර්තාකරණයේ අරමුණ උල්ලංඝනය නොවන බවටත් අපි වගබලා ගන්නෙමු.

13.3 මාධ්‍ය ආයතනවල සහ වාර්තාකරනයේ සංයුතිය සැකසීමේ දී ස්ත්‍රී පුරුෂ භාවය හා සුළුතර සමාජ ප්‍රජාව ඇතුළත් කිරීමට සංවේදී වෙමින් වර්තමාන සමාජ යථාර්ථයට අනුරූපව සමාජ විවිධත්වය, සංකීර්ණත්වය හා බහුවිධත්වය නියෝජනය වන පරිදි එය සැකසීමට අපි උත්සාහ ගන්නෙමු.

13.4 රාජ්‍ය අංශයේ වෙළඳ දැන්වීම් උදෙසා ප්‍රතිපාදන වෙන් කිරීමේදී දේශපාලනය සැලකිල්ලට ගැනීමෙන් නිදහස්ව ඒ වෙනුවට ඉලක්කගත ග්‍රාහක පිරිසට ළඟාවීම වැනි වාස්තවික නිර්ණායක පදනම් කරගන්නා ක්‍රමවේදයක් ස්ථාපිත කරගත යුතුය.

13.5 උසස් ප්‍රමිතින් අත්පත් කර ගැනීම සඳහා සංවර්ධනාත්මක විවේචන මඟින් ප්‍රතිපෝෂණ සැපයීමෙන් හා හිතකර සමාලෝචනවලින් අපට උපකාර කරන ලෙසත් ශ්‍රී ලංකාවේ නිදහස් හා ස්වාධීන ජනමාධ්‍යයක් නිර්මාණය කරනු පිණිස අප සමඟ හවුල්ව කටයුතු කරන ලෙසත් ශාස්ත්‍රීය ප්‍රජාවගෙන්, වෘත්තීය ආයතනවලින්, ක්‍රියාකාරීන්ගෙන්, වියතුන්ගෙන් හා සාමාන්‍ය පුරවැසියන්ගෙන් ද අපි ඉල්ලා සිටිමු. මේ සඳහා ඔවුන් දිරිමත් කරමු.

## 14. පුවත්පත් කලාවේදීන්ගේ සේවා සහ ආරක්ෂක තත්ත්වය වැඩිදියුණු කිරීම

නිදහසේ ස්වකීය වෘත්තියෙහි නියුක්ත විය හැකි පුවත්පත් කලාවේදීන් නොමැතිව නිදහස් මාධ්‍යයක් පැවතීමේ හැකියාවක් නොමැත. වෘත්තීය පුවත්පත් කලාවේදීන්ට නිදහසේ කටයුතු කිරීමේ හැකියාව තහවුරු කර දීමේ වැදගත්කම අවබෝධ කරගෙන සිටින අපි පුවත්පත් කලාවේදීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන නීති පැනවීමේ මෙන්ම මාධ්‍ය කර්මාන්තය තුළ පහත දැක්වෙන විශිෂ්ට භාවිතය ප්‍රවර්ධනය කිරීමේ වැදගත්කම එත්තුගෙන සිටිමු.

අ. ඉන්දියාවේ රැකියා තත්ත්වයන් විධිමත් කරනු පිණිස උපයෝගී කර ගන්නා 1955 වෘත්තීය පත්‍රකලාවේදීන්ගේ හා අනෙක් පුවත්පත් සේවකයන්ගේ (සේවා කොන්දේසි) පිළිබඳ පනතට සමාන නීති සම්මත කර ගැනීම වෙනුවෙන් කටයුතු කිරීම.

ආ. සන්නද්ධ ගැටුම් පවත්නා ප්‍රදේශවල අනතුරුදායක ලෙස වෘත්තියෙහි යෙදෙන ජනමාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සලසන තුන්වැනි ජිනීවා ප්‍රඥප්තියේ අතිරේක ප්‍රොටොකෝලයේ (1977 ජුනි 8) 79 වැනි වගන්තිය ක්‍රියාත්මක කිරීම.

ඇ. ජනමාධ්‍යවේදීන් සඳහා රක්ෂණ යෝජනා ක්‍රම ඇති කිරීම දිරිමත් කිරීම.

ඈ. පුවත්පත් කලාවේදීන්ගේ සේවා අයිතිවාසිකම් අනිසි ලෙස යොදා ගැනීම් පිළිබඳ පැමිණිලි විසඳීම සඳහා ක්‍රමවේදයක් සැකසීම ඇතුළු පුවත්පත් කලාවේදීන්ගේ අයිතිවාසිකම්, ලැදිකම් හා සුබසිද්ධිය ආරක්ෂා කරන සාමූහික සංවිධාන පිහිටුවීම ආදිය දිරිමත් කිරීම.

ඉ. ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන් ඇතුළු ජනමාධ්‍යවේදීන්ගේ සාධාරණ හා ජීවන වැටුප් ලැබීමට ඇති අයිතිය, මෙම අයිතිය වෙනුවෙන් පෙනී සිටීම සඳහා සංවිධානගත වීමට ඇති අයිතිය සහ එවැනි කටයුතු භාර ගැනීම හේතුවෙන් රැකියා පලිගැනීම්වලට භාජනය නොවීමට ඇති අයිතිය පිළිගැනීම.

ඊ. මුද්‍රිත මාධ්‍ය සේවකයින් පමණක් නොව විකාශකයින් සහ ඉලෙක්ට්‍රොනික මාධ්‍ය වෙනුවෙන් සේවය කරන සේවකයින් ද ආවරණය වන පරිදි වේතන මණ්ඩලයේ විෂයපථය පුළුල් කළ යුතුය.

ඒ. මාධ්‍ය තුළ ස්ත්‍රී-පුරුෂ භේදය අනුව වෙනස් කොට සැලකීමේ ගැටළු විසඳීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුතුය.

## 15. ජනමාධ්‍ය පුහුණුවේ අවශ්‍යතාව

මාධ්‍යයට වඩාත් පුළුල් වෘත්තීය තත්ත්වයක් ආරෝපණය කිරීමේ අවශ්‍යතාවත් විශේෂයෙන්ම, තරුණ පුවත්පත් කලාවේදීන් ශාස්ත්‍රීය හා ප්‍රායෝගික අංශ දෙකෙන්ම පුහුණු කිරීමත්, දැනටම සේවයෙහි නියුක්ත පුවත්පත් කලාවේදීන්ට ඒ පුහුණුව ලබා දීමත් සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව මෙම ප්‍රකාශනයෙන් අවධාරණය කරනු ලැබේ. ශ්‍රී ලංකා ජනමාධ්‍ය විද්‍යාලයේ දැනට තිබෙන පුවත්පත් කලාවේදී ඩිප්ලෝමා පාඨමාලාව උපාධි පාඨමාලාවක් බවට පත් කිරීම මෙයට ඇතුළත් වේ.

## 16. පුවත්පත් කලාවේදීන්ගේ ආරක්ෂාව

16.1 මාධ්‍ය සේවකයින් හා එම ආයතන පහරදීම් වලට එරෙහිව ආරක්ෂා කිරීම සඳහා යෝග්‍ය පියවර සහතික කිරීම සඳහා විශේෂිත ආරක්ෂක යාන්ත්‍රණයක් නිර්මාණය කළ යුතුය. වැරදිවලට දඬුවම් නොලැබීයාම වැළැක්වීම, ආරක්ෂා කිරීම හා විසඳීම මෙම යාන්ත්‍රණයේ විෂය පථයට ඇතුළත් විය යුතුය. නිවාරණ අංශය සම්බන්ධයෙන් වන විට යෝග්‍ය නිවාරණ ක්‍රමවේද අවශ්‍ය අවස්ථාවල දී ඒවා ලබාදීමට ඇති බලය යාන්ත්‍රණය සතු විය යුතුය. දඬුවම් නොලැබීයාම සැලකීමේ දී යුක්තිය පසිඳලීමේ ක්‍රියාකාරිකයින් පුහුණු කිරීම හරහා ඇතුළු ප්‍රකාශනයේ නිදහසට එරෙහි අපරාධ (කිසියම් තැනැත්තෙක් නිහඬ කරවීමේ චේතනාව ඇතිව සිදු කළ අපරාධ) සම්බන්ධයෙන් ඉක්මන් හා ඵලදායී විමර්ශනය සහ නඩු පැවරීම සඳහා වූ බලය යාන්ත්‍රණය සතු විය යුතුය.

16.2 මාධ්‍ය සේවකයින්ට ප්‍රහාර එල්ලවීමේ අවදානමක් ඇති අවස්ථාවල දී මාධ්‍ය ආයතන මඟින් අන්තරාදායක තත්ත්වයන් වලදී තමන්ව ආරක්ෂා කර ගැනීමට ඇති ඔවුන්ගේ හැකියාව වැඩි දියුණු කරන සුදුසු පුහුණුව හා උපකරණ ලබා දිය යුතුය.

මෙම ප්‍රකාශනයේ දක්වා ඇති පොදු සම්මුතීන්ට අදාළව ඉහත අන්තර්ගත කොට ඇති නිර්දේශ ප්‍රතිශෝධනයට ලක් කිරීම සඳහා තනි තනි සංවිධාන විසින් කරනු ලබන ඉල්ලීම් වලට අවහිරතා ඇති කරනු නොලැබේ.

## සමාප්තිය

මාධ්‍ය නිදහස හා සමාජ වගකීම පිළිබඳ කොළඹ ප්‍රකාශනයේ විසි වැනි සංවත්සරය 1998-2018: ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ පාර්ශවකරුවන් වන ශ්‍රී ලංකා වෘත්තිය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, ශ්‍රී ලංකා කර්තෘ සංසදය සහ ශ්‍රී ලංකා පුවත්පත් සමාජය යන සංවිධාන සමග එක්ව එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානයේ (UNESCO) සහ නෝර්වේජියානු රජයේ ආධාර ඇතිව, පොදුරාජ්‍යමණ්ඩලීය මාධ්‍ය භාරය, ජගත් පුවත්පත් සහ පුවත් ප්‍රකාශකයින්ගේ සංගමය (WANIFRA), ජගත් පුවත්පත් ආයතනය (IPI), ජනමාධ්‍යවේදීන් ආරක්ෂාකිරීමේ කමිටුව (CPJ) සහ නෝර්වේජියානු ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ (NJ) සහයෝගයෙන් සංවිධානය කැරුණු බවත් එමඟින් මාධ්‍ය ක්ෂේත්‍රයේ විවිධ අංශවල සහභාගීත්වයේ උපරිම ජීවය ප්‍රදර්ශනය කැරුණු බවත් අපි කෘතඥතාපූර්වකව සඳහන් කරමු.

පොදු වශයෙන් ප්‍රකාශනයේ නිදහසත් විශේෂයෙන්ම මාධ්‍ය නිදහස හා ඒ හා බැඳුණු සමාජ වගකීම ප්‍රවර්ධනය කරනු පිණිස අප දරන ප්‍රයත්නයේ දී අපගේ වැඩිදුර සහයෝගයත් එක්සත් භාවයත් වෙනුවෙන් වූ අපගේ කැපවීම යළිත් සපථ කරමු. එහෙයින් මෙම පොදු දැක්ම යථාර්ථයක් බවට පත් කර ගැනීම සඳහා කටයුතු කිරීම පිණිස අපගේ අදහස් විවිධත්වය හා අපගේ ක්‍රියාකලාපයේ වෙනස්කම් යටපත් කර ගන්නා මෙන් අපි සියලු මාධ්‍ය සංවිධානවලින් ඉල්ලා සිටිමු.

අත්සන් කළේ:

**ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය**

**නිදහස් මාධ්‍ය ව්‍යාපාරය**

**ශ්‍රී ලංකා පුවත්පත් ප්‍රකාශකයන්ගේ සංගමය**

**ශ්‍රී ලංකා කර්තෘ සංසදය**

අනුබද්ධ සංවිධාන:

**දෙමළ මාධ්‍ය සන්ධානය**

**ශ්‍රී ලංකා මුස්ලිම් මාධ්‍ය සංසදය**

**දකුණු ආසියානු නිදහස් මාධ්‍ය සංගමය - ශ්‍රී ලංකා පාර්ශවය**

**මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය**

---

නිමි/2018 සැප්තැම්බර්

Supported by

Norwegian Embassy

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය
இலங்கை பத்திரிகை ஸ்தாபனம்
Sri Lanka Press Institute

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය (SLPI)
96, කිරුළ පාර, කොළඹ-05, ශ්‍රී ලංකාව
දුර: +94-11-5353635   ෆැක්ස්: +94-11-5335500
ඊ මේල් : info@slpi.lk   වෙබ්: www.slpi.lk